**EDCS**

අධ්‍යාපන සමුපකාර සමිතිය
கல்வி கூட்டுறவுச் சங்கம்
Education Co-operative Society

# තනතුර පුරප්පාඩු

## සාමාන්‍යාධිකාරී (කොන්ත්‍රාත් පදනම)

සමිතියේ ප්‍රධාන විධායක තනතුර වන සාමාන්‍යාධිකාරී තනතුර වෙනුවෙන් එක් වසරක කොන්ත්‍රාත් කාලයකට යටත්ව බඳවා ගැනීම සඳහා 2022.09.23 දින දක්වා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

මෙම තනතුර සඳහා බඳවා ගැනීම සිදු කරනුයේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ 2016/01 දරන 2016.11.01 දනමැති චක්‍රලේඛයන්ට අනුකූලව වන අතර, එකී සුදුසුකම් පහත දැක්වේ.

**සුදුසුකම්**

01. පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජ, කළමනාකරණ, ආර්ථික විද්‍යා, ගණකාධිකරණ. මානව සම්පත් කළමනාකරණ, නීතිය, සමාජ විද්‍යාව යන විෂයයන් එකක් හෝ ඇතුළත් වන පරිදි පශ්චාත් උපාධියක් සමග පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක විධායක මට්ටමේ වසර 02 ක පළපුරුද්ද.

**හෝ**

02. පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජ, කළමනාකරණ, ආර්ථික විද්‍යා, ගණකාධිකරණ, මානව සම්පත් කළමනාකරණ, නීතිය යන විෂයයන් එකක් හෝ ඇතුළත් වන පරිදි උපාධියක් සමග පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක විධායක මට්ටමේ වසර 05 ක පළපුරුද්ද.

**හෝ**

03. කාර්මික විද්‍යාලයේ හෝ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ උසස් ඩිප්ලෝමාව සමග පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක විධායක මට්ටමේ වසර 06 ක පළපුරුද්ද.

**හෝ**

04. පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමග පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක විධායක මට්ටමේ වසර 07 ක පළපුරුද්ද.

**හෝ**

05. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර උ/ පෙළ සමත්වීම සමග පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක විධායක මට්ටමේ වසර 08 ක පළපුරුද්ද.

**වයස් සීමාව :** අවුරුදු 60 දක්වා පමණි

**සාමාන්‍යාධිකාරී හට පැවරෙන රාජකාරීන් හා බලතල**

දිවයිනේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවයේ නියුතු වූ 200,000 පමණ සාමාජිකත්වයෙන් සැදුම්ලත් මෙම සමිතිය ශාඛා කාර්යාල 21 කින් සමන්විතය. කාර්ය මණ්ඩලය 938කි. ප්‍රධාන ව්‍යාපාරික කටයුත්ත වනුයේ සාමාජිකයින්ට ණය පහසුකම් සපයා දීම වේ.

සමුපකාර සමිති පනත, රීති මාලාව, සමිතියේ අතුරු ව්‍යවස්ථාව සහ කාරක නියෝග මාලාවට හා රටේ පොදු නීතියට අනුව සමිතියේ ව්‍යාපාරික කටයුතු මෙහෙයවීම හා කළමනාකරණය කිරීම සාමාන්‍යාධිකාරී තනතුරේ වගකීම වන්නේය.

**අයදුම් කිරීම සඳහා උපදෙස් :**

- **"සාමාන්‍යාධිකාරී තනතුර (කොන්ත්‍රාත්)"** යනුවෙන් වම්පස ඉහළින් සඳහන් කළ ලිපි කවරයක බහා ජීවදත්ත, පළපුරුද්ද හා සුදුසුකම් සනාථ කෙරෙන සහතික පිටපත්ද සමගින් අයදුම්පත්‍රය 2022.09.23 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් පහත ලිපිනයට එවිය යුතුය.
- සමුපකාර සමිතිවල සේවකයින් අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඔවුන් අයදුම්පත් ඉදිරිපත් කළයුතු වන්නේ තමන් සේවය කරන සමුපකාර සමිතිය මගිනි.
- වැටුප් හා අනෙකුත් පහසුකම් සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණයේදී සාකච්ඡා කෙරෙනු ඇත.
- අයදුම්කරුවන් අතරින් සුදුස්සෙකු තෝරා ගැනීමේ පූර්ණ බලය සමිතියේ අධ්‍යක්ෂ

**ප්‍රධාන ලේකම්**

**සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය.**

**අංක 294, ගාලුපාර, කොළඹ 03.**

**දු.ක. 011-2370068, 011-2575605**